# පුරප්පාඩු

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

# රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තාක්ෂණ නිලධාරී (ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ / තාක්ෂණ නිලධාරී / කාර්මික නිලධාරී තනතුරක සේවය කර විශ්‍රාම ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් :**

(අ) **වයස් සීමාව :** වයස අවුරුදු 67 ට නොවැඩි විය යුතුය.

(ආ) **අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :**

| **තනතුර** | **තාක්ෂණ නිලධාරී (ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු)** |
|---|---|
| **අධ්‍යාපන සුදුසුකම්** | I. භෞතික විද්‍යාව / රසායන විද්‍යාව ඇතුළත්ව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත් වීම සහ<br>II. සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම. |
| **වෘත්තීය සුදුසුකම්** | මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව<br>හෝ<br>අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිමනු ලබන ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>හෝ<br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම<br>හෝ<br>ගොඩනැගිලි අලුත්වැඩියා හා නඩත්තු (සිවිල් ඉංජිනේරු) ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම,<br>හෝ<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

01. බඳවා ගැනීමේ ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් ලබන අයදුම්කරුවෙකු බඳවා ගනු ලැබේ.

02. සේවා කොන්දේසි : මෙම තනතුර එක් අවුරුදු කොන්ත්‍රාත් කාල සීමාවකට යටත්වේ.

03. වැටුප : සම්පූර්ණ මාසික දීමනාව රු. 38,840.00

සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු පිළිබඳව සියලු විස්තර සහ තමන් පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ ඇමතිය හැකි දුරකථන අංක සඳහන් කරන ලද අයදුම්පත්‍ර, අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ සඳහන් කොට 2021.03.05 දින හෝ ඊට පෙර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතිකපත්වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.**
**2021.02.05**

Source: Dinamina, Daily News (2021.02.10)